දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02 /2019.

මගේ අංක:එස්.ටී.පී.පී.එස්/2019,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ - 09.
2019 ජනවාරි මස 17 වන දින.

සියලුම අධිකාරීවරුන්/සහකාර අධිකාරීවරුන් වෙත.

<u>2019 වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව සම්බන්ධවයි.</u>

භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක:එෆ්.අයි.එන්/1501/එෆ්/192/18/ඒ.බී/ඩී හා 1985.06.18 දිනැති චක්‍රලේඛ ප්‍රකාරව එහි දෙවන ඡේදයට අනුව,

01. පසුගිය වර්ෂයේ එනම් 2018 වර්ෂයේ සංඛ්‍යාලේඛන වාර්තාව 2019 අප්‍රේල් මස 30 වන දිනට පෙර මා විසින් අමාත්‍යාංශයට ඉදිරිපත් කලයුතුය.

02. බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනයවන සෑම ආයතනයකින්ම වාර්තා ලබාගෙන එම දත්ත වගු ගතකොට එහි සම්පිණ්ඩනය, දෙපාර්තමේන්තුවේ වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව ලෙස සැකසිය යුතුය.

03. <u>ඔබ ආයතනයේ දත්ත ඇතුලත් සංඛ්‍යා ලේඛනවාර්තාව 2019 මාර්තු මස 15 දිනට පෙර මූලස්ථාන සංඛ්‍යාලේඛන අංශය වෙත ලැබීමට සැලැස්වීම අනිවාර්ය වේ.</u>

04. ඉතා පැහැදිළිව හා නිවැරදිවත්, සන්සන්දනාත්මකව දත්තයන් ඉදිරිපත් කිරීම ඔබගේ වගකීම බව සැලකිය යුතුය.

05. <u>දත්ත සටහන් කිරීමෙන් පසුව සියල්ල ඉතා නිවැරදි බවට අදාල අංශයන් භාර ජේලර්වරුන් විසින් සෑම පිටුවකම නිලමුද්‍රාව තබා අත්සන් තැබීම අනිවාර්ය වේ.</u>

06. වාර්තා සැකසීමට අවශ්‍ය දත්ත සටහන් පොත් මේ සමඟ එවන අතර, එහි පිටපතක් ඔබ ආයතනයෙහි තබාගැනීමට වගබලා ගතයුතුය.

07. 2019 වාර්ෂික සංඛ්‍යාලේඛන දත්ත සටහන් පොත් ලද බව බන්ධනාගාර කොමසාරිස් (සංඛ්‍යාලේඛන) වෙත දැන්විය යුතුය.

එච්.එම්.එන්.සී.ධනසිංහ.
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.